# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
### 2010 අගෝස්තු /සැප්තැම්බර්

### මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව DMAT E3015

**නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි** **කාලය : පැය 03 යි**

---

01. ඔබ අධ්‍යයනය කර ඇති නාට්‍යවලින් උදාහරණ ගෙන, සුසාදිත නාට්‍යවල (well made plays) දැකිය හැකි පොදු ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

02. ඇන්ටන් චෙකොෆ්ගේ චෙරිවත්ත (Cherry Orchard) නමැති නාට්‍යය ඇසුරින් ඔහුගේ නාට්‍ය රීතියේ සුවිශේෂතා පිළිබඳ විමසීමක් කරන්න.

03. හෙන්රික් ඉබ්සන්ගේ යථාර්ථවාදී රචනා රීතියේ සුවිශේෂතා බෝනික්කි ගෙදර (Doll's House) නාට්‍ය කෘතිය ඇසුරින් විමර්ශනය කරන්න.

04. "විසිවන සියවසේ යුරෝපයට මෙන්ම ඇමරිකාවට ද නළු පුහුණුව අත්‍යාවශ්‍ය අංගයක් බව පෙන්වා දුන්නේ කොන්ස්ටන්ටින් ස්ටැනිස්ලව්ස්කි ය." මෙම අදහසට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

05. විසිවන සියවසේ මුල් භාගයේ ඇති වූ සමාජ, දේශපාලන හා චින්තනමය පරිවර්තනයන් හේතු කොටගෙන යුරෝපීය නාට්‍ය කලාවේ ඇති වූ වෙනස්කම් මොනවාද?

06. බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට්ගේ රංග සංකල්ප පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. ටෙනසි විලියම්ස්ගේ "පුංචි පළිඟු රූප" (Glass Menagerie) නාට්‍ය කෘතියේ සුවිශේෂී ලක්ෂණ පරීක්ෂා කරන්න.

08. අසම්මත හෙවත් න්‍යාය විරෝධී නාට්‍යවල පවතින සම්ප්‍රදායට හා සම්මතයට එරෙහි ස්වරූපය සැමුවෙල් බෙකට්ගේ "වේටිං ෆෝ ගොඩෝ" (ගොඩෝ උන්නැහේ එනකං- සුගතපාල ද සිල්වා පරිවර්තනය) නාට්‍යය ඇසුරින් පැහැදිලි කරන්න.

09. පහත සඳහන් මාතෘකා <u>හතරකට (04)</u> කෙටි සටහන් ලියන්න.

    i. දිළිඳු රංගය (Poor Theatre)
    ii. කුරිරු රංගය (Theatre of Cruelty)
    iii. සිද්ධි රංගන (Happenings)
    iv. මෙයර්හෝල්ඩ්
    v. අර්වින් පිස්කැටෝර්
    vi. ඉයුජින් අයනෙස්කෝ

****************************